අඳුන් සිහින

13

හේමමාලා හේරත් ලියන නවකතාව

මෙතක් කතාව:

රිදීමා, මහීකා, අමා සහ රුචිරා ශ්‍රී ලංකාවේ සිට මෙල්බර්න් කරා පැමිණි, විශ්ව විද්‍යාල ශිෂ්‍යාවෝය. රිදීමා තමා දක පුරුදු තරුණයෙකු නිතර දකින මුත්, ඔහු කවුදැයි කීමට තරම් මතකයක් ඇයට නැත්තේය. මහීකාගේ පෙම්වතා වන අජයගේ ළඟම මිතුරා දිනූෂ රිදීමාට ආදරය කරන මුත්, නිශ්ක නැමැති තරුණයා පිළිබඳව රිදීමා තුළ ඇත්තේ කෙබඳු හැඟීමක්දැයි යහළුවන් තුළ මතුවන්නේ ගැටළුවකි. මින් රිදීමාද බලවන් සේ පීඩා විඳී. අවසන මෙම රහස විසඳාගැනීම සඳහා සියල්ලෝම ශ්‍රී ලංකාව බලා පිටත්වෙති. අජය, දිනූෂ සමග ද, රිදීමා සිය යෙහෙළියන් හා පිංචි කෙල්ලද සමග මේ රහස අනාවරණය කරගැනීම සඳහා වෙහෙසෙති.

අද එතැන් සිට:

රිදීමා පින්තූරය දෙස බලාගත් වනම බිමට පාත්වනු මහිකාත්, අමාත්, පිංචිත් දුටුවේ එකවිටය.

"අම්මා..."

රිදීමාගේ මුවින් පිටවුයේද, සිතට ආ එකම සිතිවිල්ල වූයේද අම්මාය.

බිත්තියේ එල්වා තිබුණේ සුදු මැණිකේගේ හෝ සුදු බේබිගේ පින්තූරයක් නොව අම්මාගේ පින්තූරයකි.

අමා, රිදීමා හාන්සි කළාය.

"පිංචි ගිහින් කොට්ටයක් හොයාගන වරෙන්. සුදු බේබිගේ කාමරෙන් බේබිට පොරවන්න රෙද්දකුත් අරන් වරෙන්...."

පිංචි මුදාහල කිරිල්ලියක් මෙන් ඉගිලුණාය.

"මොකද උණේ ?" මහීකා ඇසුවාය.

"මේ පොඩි කලන්තයක් !" අමා පැවසුවේ, රිදීමා වෙතින් නෙත් ඉවතට ගනිමිනි. "මෙතන නිකං මනුස්සයෙකුටත් හුස්ම ගන්න බැරි එකේ රිදීමාට කලන්තේ දාන එක පුදුමයක්යැ."

"හැබැයි ඒක උණේ අර පින්තූරේ දැකලා..." මහීකා පැවසුවාය.

"ඒකේ ඉන්න ගෑනුකෙනා හරියට රිදී වගේ..." ඊළඟට ඇය මුමුණාගත්තේ තමාටමය.

අමාද සෙමෙන් නැගිට ඒ වෙත ආවාය.

ඡායාරූපයෙහි වූයේ, තාමත් තරුණ වියෙහි උන් කාන්තාවකි. ඉහිළිව ගොතන ලද, රැළි ගැසුණු ඇගේ දිගු කෙස් කළඹ එක් උරයකින්, ලය මතට වැටිණි. ඇගේ උඩුකය වැසී තිබුණේ චාම්, සුදු බ්ලවුසයකිනි. උස්කර වටා රේන්දයක් දිවගිය අතර, ඒ අතරින් යැවූ රිබන් පටිය, ගෙල මුලට වන්නට ගැට ගසා තිබිණ. අය ඡායාරූපයට මුහුණ දී සිටියේ සිනාව උතුරන මුහුණකිනි. විකසිත දෑසකිනි. අය යොවුන් වියේදී 'රිදීමා' බඳුම වන්නට ඇතැයි අමා කල්පනා කළාය. ඇගේ දෑස, සිනහව සියල්ලම රිදීමාගේ බඳුවිය.

"අම්මගේ කපාපු පලුව..."
රිදීමා දෙස බැලූ මහිකා සිතුවාය.

"කියලා වැඩක් නෑ...."
ඇගේ සිත දුටුවාක් මෙන් අමාද පැවසුවාය.

බිම දිගාව හුන් රිදීමාට, තම යෙහෙළියන්ගේ කතා නෑසිණි. අය සිටියේ වෙනත්ම ලොවකය. වෙනස් රූපරාමු ගොඩක් අතරය.

තට්ටු නිවසකැයි සිතිය හැකි වූ වඩා විශාල නොවූ නිවසක, සාලයේ කුඩා රිදීමා හිඳ සිටියාය. ඇගේ මුහුණ සිනහවෙන් පිරී තිබුණේය. 'අම්මා' ඇය දෙස නැවී, කුමක්දෝ පැවසුවාය. රිදීමාගේ මුවට නැගුනේ සුරතල් වදනකි. අම්මා වෙතින් වහනය වූයේ කුමක් හෝ මල් සුවඳකි. අතවල් දෙය යැයි අළුවා ගත නොහැකි අන්දමේ අපූරු, සියුම් සුගන්ධයකි. එක්කොට බැඳ තිබුණු කෙහෙරැළි අවුල්ව මුහුණට වැටී තිබිණි. ඇගේ මුහුණේ වූ සිනහව, රිදීමාගේ සිත පුබුදු කළේය. අය යමක් කියමින්, තමාට යමක් කවනු රිදීමා දුටුවාය. ඒ සමගම අය පසෙකට හැරී, තවත් කාටදෝ කවනු ඈ දුටුවාය.

"දඩාං...." අම්මා අතවූ පිඟාන විසිවී ගියේය. එහි වූ ආහාර සියල්ල සාලය පුරා පැතිරිණ.

"ඇයි වූටි මැණිකේ ?"

යැයි අසමින් සාලයට දිව ආවේ තරබාරු ගැහැණියකි. බියට පත් රිදීමා හැඩීමට පටන්ගත්තාය. අය තුරුලට ගත් අම්මා,

"නෝට් සුද්දි" පසෙක වූ තවත් දැරියකට කීවාය. දැරියගේ මුහුණ දුටු රිදීමා තුල පැතිරගියේ දැඩි ආදරයකි. සතුටකි. ශෝකය මිශ්‍ර පසුතැවිල්ලකි. එමෙන්ම බියකි. ඇගේ රැව රිදීමාට සමාන වූයේ, ඇගේ කෙස් කළඹ වඩා රැළි ගැසී තිබීමත්, ඒ දෑසෙහි වූ දඟකාර ගතියත්, දෙතොලෙහි වූ මුරන්ඩු සිනාවත්ය. ඈ නිහඬව අම්මා දෙස බලා සිටියාය.

"මොකද මේ කලේ ?"
අම්මා ඇසුවේ නෝක්කඩුවක ස්වරූපයෙනි.

"සුදුමැණිකේ...." රිදීමාගේ හඳ කෑ ගෑවේය.
"රෙහානා....." අම්මා පැවසුවාය.

ඒ රිදීමාගේ නිවුන් සහෝදරියයි. දෙදෙනාම උන්නේ අවුරුදු පහක් පමණ වයසැති කාලයේ සිදුවෙමින් තිබූ රූපරාමු පෙළක් තුලය.

සැනෙකින් එය වෙනස් වූයේය. කුඩා උද්‍යානයක ඔවුහු සෙල්ලම් කරමින් උන්නෝය. දිගුසායක් හැඳි තරබාරු ගැහැණිය, රිදීමා ඔන්චිල්ලාව මත තබා පැද්දුවාය. එය උඩයන වේගය පවා රිදීමාගේ හදවතට දැනුදු දැනුණේය. රෙහානා සිටියේ බිමවූ ගල්කැට අතුලමිනි.

"චටාස් !" යන හඬක් එකවරම ඇසුණේය. කෑ ගසා ඔන්චිල්ලාව අත්හළ ගැහැණියගේ නලලතින් ලේ බිඳුවක් හැලුණේය. විසි වූ ඔන්චිල්ලාවෙන් කුඩා රිදීමා බිම වැටුණාය. අම්මා කොහෙන්දෝ මතුවූවාය. ඈ වහා දුවවුත් රිදීමා වඩා ගත්තාය.

"සුදුමැණිකේ " යැයි යමක් කීමට තැනුවද, අම්මා ඊට ඉඩ නුදුන්නාය.

රෙහානා බිම පෙරලෙනු, අඩනු, ළඟට එන්නවුන්ට පයින් ගසනු රිදීමා දුටුවාය.

"ඒ ඇයි ?" රිදීමා ප්‍රශ්ණ කර ගත්තාය.

"බේබිට බෙහෙත් දුන්නේ නැද්ද ?" අම්මා කාන්තාවගෙන් වමසුවාය.

"දුන්නා වූටි මැණිකේ !"
කාන්තාව තවත් කඳුලක් පිසදාගත්තාය.

"කමක් නෑ සුමනාවතී. අපි ගිහින් ඔය තුවලෙට බෙහෙත් ටිකක් දා ගනිමු....." අම්මා මඳකට නැවතී, ගැහැණියගේ නළල පරීක්ෂා කළාය.

"ලොකු තුවාලයක් නෑ. උඩින් පිපිරිලා විතරයි...."

තාමත් බිම පෙරලමින් උන් දැරිය මෙල්ලකළේ සුමනාවතිය. අම්මාගේ බෙල්ල බදාගත් ගමන් උන්නේ රිදීමාය. රෙහානාගේ දෙනෙතින් ගැලූ කඳුළු ඈ මෙවර හොඳහැටි දුටුවාය.

තවත් රූපරාමුවක් ඇඳී, මැකී ගියේය.

ඇය එවර උන්නේ නිදන කාමරයක වූ කුඩා ඇඳන් දෙකින් එකකය. උස්, මහත පුද්ගලයෙක්, රිදීමා තම උකුලේ තබාගෙන උන්නේය.

"සුද්දිව ඩොක්ටර් ළඟට ගෙනිච්චද ?" ඔහුගේ හඬ ඉතා ගැඹුරු විය.

"ඔව් ! අම්මා නැම්, නිදමින් සිටි රෙහානාගේ කුඩා පොරෝනය සකස් කළාය. ඇගේ දෑසෙහි වූයේ දුක්මුසු බැල්මකි. ඈ පහත්වී, කුඩා දැරියගේ මුහුණ සිපගත්තාය.

"මම එන පහලොස්වෙනිදා යනවා වූටි මැණිකෙ...." අම්මා පහරක් වැදුණු එකියක මෙන් හිස එසවුවාය.

"එතකොට අපි ?"
"ඔයාට මාත් එක්ක එන්න කියලා කියන්නේ අද ඊයෙක ඉඳන් නෙවෙයිනේ ! මගේ ළඟට එන්නේ නැත්තේ ඔයයි...."

අම්මාගේ කපොල ඔස්සේ පැමිණි කඳුලක් පහළට රෑරා ගියේය.

"මම කොහොමද එහෙම එන්නේ ?" ඈ ඇසුවාය. "දැන්නම් රෙහානත් එක්ක කොහේවත් යන්න බෑ.

හිඳ සිටි පුද්ගලයා, රිදීමා හෙමිහිට බිමින් තබා නැගී සිටියේය. ඔහු අම්මාගේ කම්මුලෙහි වූ කඳුළු බිඳුවක් සිරුවට පිස දමනු රිදීමා බලා සිටියාය.

"මම ඉක්මණින් එනවා වූටියේ. එතකල් ළමයි දෙන්නා බලාගෙන පරිස්සමින් ඉන්න..."
ඔහු ඉකිගසන අම්මා තම තුරුලට ගත්තේය. රිදීමා එම පුද්ගලයා වෙත ගොස් ඔහුගේ දෙකකුල බදා ගන්නා හැටි වැඩිවිය පැමිණ සිටි රිදීමා දුටුවාය.

"රිදී.... රිදී....."

කවුදෝ ඇය සොලවනු රිදීමාට දැනුණේය.

"ටිකක් ඉන්න. ඔච්චර හොලවන්න එපා....." කවුදෝ අණ කළේය. රිදීමා සෙමෙන් පියවි ලොවට පිවිසියාය. ඇය දෑස් හරින විට මහීකා, අමා මෙන්ම හඳින් අය්යා, අජය සහ දිනූෂද එහි උන්නෝය.

"මොකද මේ ?" හඳින් අය්යා ඇගෙන් ඇසුවේය. ඔහුගේ දෑසෙහි පිරි තිබූ දුක, රිදීමා හඳුනාගත්තාය.

"අපි යමු පහළට....."

තරුණයන්ගේද උදව් ඇතිව, හඳින් අය්යා රිදීමා ඔසවා ගත්තේය. රිදීමා ඔහුට තුරුළු වූයේ ඉමහත් සෙනෙහසිනි.

තරප්පු පෙලෙන් පහළට ඔවුන් තමා කෙසේ ගෙනාවාදැයි මතකයක් ඇය සතු නොවිය. යළි ඇස් හරිනවිට ඇය සිටියේ ඇගේ සුපුරුදු නිදන කාමරයේය. සියල්ලෝම තැන්, තැන්වලට වී ඇය දෙස බලා උන්නෝය.

සියළුම මුහුණුවල සටහන් වූයේ බරපතළ බවකි.

රිදීමා හිඳගැනීමට තැනුවාය.

"ඔහොම ඉන්න පොඩ්ඩක් හෙළවෙන්නේ නැතුව...." අමා මෘදු ලෙස තෙපලුවාය.

හඳින් අය්යා මේසය අසල වූ පුටුවෙහි හිඳ හිස අත් ගසාගෙන උන්නේය. දිනූෂ දොර අසල බිත්තියට පිටදී උන් අතර අජය, සිටියේ මහිකා අසලින් සිටගෙනය.

"ඇත්තටම මොකද මේ වෙන්නේ හඳින් ?" අමා විමසුවාය. හඳින් අය්යා කළේ හිස සැලීම පමණකි. අජය, දිනූෂ දෙස බැලිය. දිනූෂ බිම බලාගත්තේය.

"දැන්වත් ඇත්ත කියන්න. මේක වහං කරලා අපි කාටවත් වෙන සෙතක් නැහැ. රිදීමාගේ හිත රිදෙනවා. අපෙත් හිත රිදෙනවා, හඳින් !"

අමාගේ ස්වරය දැඩි වූයේය.

"මේ රහස හන්දා බලන්න රිදීමා විඳින දුකක්. ඇත්ත කතාව කීවොත්, එයාගේ මතකයට එන්නේ 'මෙන්න මේවා' කියලා එයාට හිත හදාගන්න පුලුවන්. එයා ඒක කොච්චර පිළිගන්නවද, නැද්ද කියන එක අපට කියන්න බෑ. ඒත් ඒකෙන් එයාට මොනයම් ආකාරයට හරි ළඟෙන්නේ සැනසීමක්...."

අම්මා දොර තීරය ඈත් කරමින් කාමරයට ඇතුලු වූවාය. ඇගේ සෝබර මුහුණ දුටු රිදීමා තුළද ඇති වූයේ මහා දුකකි.

"අම්මා" ඈ මිමිණුවාය. අමාද, මහිකාද රිදීමාගේ මව දෙස බැලුවෝය.

"මේ නම් රිදීමාගේ මව නෙමෙයි...." යන සිතුවිල්ල දෙදෙනාම එක්වර සිතුවෝය.

ඒ ඡායාරූපයේ උන් ගැහැනියට වඩා රිදීමාගේ මව බෙහෙවින් වෙනස් වූ නිසාය.



ළඟන කළාපයට